ගිරිබාව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 අගෝස්තු 25 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ගිරිබාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 02 ක ශේෂයන් හා ඒවාට අදාල උපයෝගී ලේඛණවල ශේෂයන් අතර රු.35,844 ක නොසැසඳීම් පැවතුණි.

1.3.2 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.64,714,391 ක් විය. ඒ තුල තැන්පතු යටතේ වර්ෂ දෙකකට වැඩි කාලයක සිට පැවත එන රු.39,500 ක තැන්පතු ශේෂ 3 ක් පැවතුණි.

1.3.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.979,307 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

1.3.4 <u>නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම</u>

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති අංක 218 ප්‍රකාරව සභාවේ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

02 <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.1,396,022 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.130,582 ක් වීමෙන් මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.1,526,604 ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.25,527,544 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.22,604,361 ක් වූ ප්‍රාග්ධන වැය

ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.4,319,205 ක අතිරික්තයක් බවට පත්ව ඇත.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.26,386,733 න් ආසන්න වශයෙන් සියයට 80 ක් ලෙස රු.21,042,779 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.25,527,544 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල්වලින් සමන්විත විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.24,990,711 න් ආසන්න වශයෙන් සියයට 73 ක් ලෙස රු.18,186,482 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් ආසන්න වශයෙන් සියයට 92 ක් ලෙස රු.16,777,427 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.22,604,361 න් ආසන්න වශයෙන් සියයට 1 ක් ලෙස රු.263,899 ක් පමණක් සභා අරමුදලින් වැය වී තිබූ අතර ආසන්න වශයෙන් ඉතිරි සියයට 99 ක් වූ රු.22,340,462 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදනවලින් සිදු කල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

2.3 ආදායම් පරිපාලනය

බදු කුලී

සභාව සතු වත්කම් බදු දීම් යටතේ 2014 වර්ෂය සඳහා අවම ලංසු එකතුව රු.324,854 ක් වූ සතිපොල මස් කඩ 03 ක් හා මාළු කඩ 01 ක් බදු දීමට නොහැකි වී තිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් වත්කම් බදු දීම්වලට අදාලව එකතුව රු.117,882 ක් වූ හිඟ ආදායම් සම්බන්ධයෙන් නඩු පවරා තිබූ අතර එම නඩු පිළිබඳ පසුවිපරම් කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම නඩු ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

(ආ) සභාව සතු වාහන 11 ක ඉන්ධන පරීක්ෂාව කර නොතිබූ අතර එක් වාහනයක ඉන්ධන පරීක්ෂාව අවසන් වරට වර්ෂ 02 ට පෙර සිදු කර තිබුණි. එමෙන්ම සභාව සතු වාහන 04 ක් ලියාපදිංචි කර ආදායම් බලපත්‍ර ලබා ගැනීම් හා රක්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව විසින් 2013 වර්ෂයේ ආරම්භ කර ක්‍රියාත්මක කරන ලද කුට්ටිගල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.

3.2 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුලා‍ය ප්‍රකාශන වල ජංගම වත්කම් යටතේ පවතින රු.1,266,033 ක් වටිනාකමැති වත්කම් 08 ක් අභාවිත වත්කම් විය.

(ආ) අංක 252-6353 දරන කැබ් රථය 2013 වර්ෂයේ සිට අවස්ථා 05 කදී රු.1,049,750 ක් වැය කර අළුත්වැඩියා කර තිබුණද වර්තමානයේදී ද ධාවන තත්ත්වයේ නොතිබුණි.

3.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂය තුල ඉටු කිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.5,400,000 ක් වූ ව්‍යාපෘති 41 ක් ඉටු කර නොතිබුණි.

04 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය